# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක 7,873 — 1931ක්වූ ජූලි මස 31 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

වර්ෂ 1931ක්වූ මැයි මස 22වෙනි දින නිකුත්කරණලද අංක 7,855 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණලද නොම්බර 9,937, 9,938, 9,939 සහ 9,940යේ ඉඩම් විකිණීමේ දැන්වීම්පත්‍ර මෙයින් අවලංගුකරන්ට යෙදුනා ඇත.

එච්. ඊ. ජෑන්ස්,
බැඳබලන ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ ජූලි මස 23වෙනි දින දීය.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—ගම්පල ක්‍රීඩා පිටිටෙනියට යන පාර ගංවතුර ජලමට්ටමෙන් ඉස්සීමට යන කොටසක් පලල් කිරීම පිණිසක් මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම් :—

සිතියමේ නො. 9,079. ගම—(යෝජනාකර තිබෙන) ගම්පල ලෝකල් බෝඩ් සීමාවතුල පිහිටි ඇරුගොඩ සහ ගම්පලවෙල.

| නො. | ඉඩමේ නම. | | අත්දම. | | අයිතිකම්කියන්නා. | | මහන, | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අඹකොටේකුඹුර | .. | කුඹුර | .. | ඉල්ලවතුරේ ඊ. වී. ඇම්. පුංචිබන්ඩා | .. | 0 | 0 | 11·49 |
| 2 | එම | .. | එම | .. | ඇරුගොඩ හොඹනා වෙද | .. | 0 | 0 | 7·80 |
| 3 | එම | .. | එම | .. | කොළඹ බෞද්ධ පරමවිඥාණවාදී සමාගම | .. | 0 | 0 | 4·33 |
| 4 | එම | .. | එම | .. | එම .. | .. | 0 | 0 | 2 |
| 5 | එම | .. | එම | .. | එම .. | .. | 0 | 0 | 0·10 |
| 6 | මීකුලවත්ත | .. | වවා තිබෙන වත්ත | .. | එම .. | .. | 0 | 0 | 2·60 |
| 8 | එම | .. | එම | .. | ගම්පල මීකුලවත්ත විහාරේ වරසම්බෝධි උන්නාන්සේ | | 0 | 0 | 1·50 |
| 9 | මීකුලවත්තකුඹුර | .. | මුඩුබිම | .. | ගම්පලවෙල නවරත්න ලොකුබන්ඩා | .. | 0 | 0 | 0·10 |
| 10 | මීකුලවත්ත | .. | වත්ත | .. | එම .. | .. | 0 | 0 | 0·77 |
| 12 | එම | .. | වවා තිබෙන වත්ත | .. | එම .. | .. | 0 | 0 | 0·55 |
| 14 | එම | .. | වත්ත | .. | එම .. | .. | 0 | 0 | 0·40 |
| 15 | එම සහ මීකුලවත්තකුඹුර | .. | මුඩුබිම | .. | එම .. | .. | 0 | 0 | 0·49 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින පෙරවරු 11යේ තනියමට ගම්පල ලෝකල් බෝඩ් කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර පළාතේ ආණ්ඩුවේ උප ඒජන්ත මහතා.

වර්ෂ 1931ක්වූ ජූලි මස 27වෙනි දින මහනුවර කච්චේරියේදීය.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අල්වායි පාර පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 8,027. ගම—බස්නාහිර පූලෝලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වත්තලන් .. | තල්වත්ත, අවුරුදු 30කට වැඩි වයසැති තල්ගස් 3ක් තිබේ | වේලප්පර් කතිර්ගාමු, වේලප්පර් මුරුගේසු, බස්නාහිර පූලෝලියේ පදිංචි සිතම්පර පුල්ලේ අරුනාසලම් සහ නැගෙණහිර පූලෝලියේ පදිංචි වේලායුතම් පුල්ලේ අරුනාසලම් | 0 0 1·11 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 21වෙනි දින පෙරවරු 10යේ කාලසමට පරිත්තිතුරේ රෙව්හවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි. ඉඩම සම්බන්ධවූ ඔප්පුද ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1931ක්වූ ජූලි මස 23වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ජේ. ඩී. ඩයිසන්,
උතුරු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වමහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—බස්නාහිර පූලෝලියේ ප්‍රසිද්ධ වෙලඳ ශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 8,028. ගම—බස්නාහිර පූලෝලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උපගෙන .. | මුඩුබිම .. | සුප්පරමනියන් කන්දය්යා, කුමාරසාමි වේලායුදර්, වී. ආරුමුගම්ගේ ස්ත්‍රී පොන්නාච්චි, නැසීගිය කේ. කදිරිතම්බිගේ ස්ත්‍රී පාරුපතිපිල්ලෙ සහ බස්නාහිර පූලෝලියේ පදිංචි නැසීගිය ඈත්. විනාසිතම්බිගේ ස්ත්‍රී වල්ලිප්පුල්ලේ | 0 1 7·50 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 21වෙනි දින පෙරවරු 10යේ කාලසමට පරිත්තිතුරේ රෙව්හවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉඩම සම්බන්ධවූ ඔප්පුද ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1931ක්වූ ජූලි මස 23වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ජේ. ඩී. ඩයිසන්,
උතුරු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වමහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පූලෝලියේ ග්‍රාමසංගමයේ උසාවිය පිහිටිවත්ත විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණයඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 8,033. ගම—නැගෙනහිර පූලෝලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඉරබිපුල්ලේසිමා | තල්වත්ත, තල්ගස් 6ක්ද, අවුරුදු 50 වයසැති පොල්ගහක්ද, ගලෙන් බන්දවනලද ලිඳක්ද තිබේ | සිංගප්පූරුවේ පදිංචි වල්ලිපුරම් සෙල්ලෙයා, නැගෙනහිර පූලෝලියේ පදිංචි ඈත්. වල්ලිපුරම්ගේ ස්ත්‍රී, සින්නපුල්ලේ, වී. තම්බුගේ ස්ත්‍රී, පුල්ලේ, ඒ මුරුගේසුගේ ස්ත්‍රී, කනකම්මා, වී. සභාපතිගේ ස්ත්‍රී, පූරනම්, බස්නාහිර පූලෝලියේ පදිංචි වී. සිනිවාසගම්ගේ දූ රත්නම් සහ නැගෙනහිර කරවෙට්ටියේ පදිංචි කන්දය්යා පෙරමුත්තු රජරත්නම් | 0 0 20·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 21වෙනි දින පෙරවරු 10යේ කාලසමට පරිත්තිතුරේ රෙව්හවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉඩම සම්බන්ධවූ ඔප්පුද ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1931ක්වූ ජූලි මස 23වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ජේ. ඩී. ඩයිසන්,
උතුර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වමහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පරිත්තිතුරේ ප්‍රසිද්ධ වැසිකිළියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 8,034. ගම—පරිත්තිතුරේ සනීපාරක්ෂක සමිතියේ සීමාතුල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තිරුවුලාවත්තෙත (තක්සේරු නො. 372) | තල්වත්ත, අවුරුදු 40ක් වයසැති තල්ගස් 6ක් තිබේ | කුමාරසාමි සිවලිංගම්, කුමාරසාමි ත්‍යාගරාජ, කුමාරසාමි සන්තිරසේගරම් සහ පරිත්තිතුරේ පදිංචි කුමාරසාමි සබාපතිපුල්ලේ | 0 0 4·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාවා තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 21වෙනි දින පෙරවරු 10යේ කාලයට පරිත්තිතුරේ රෙස්ට්හවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි. ඉඩම සම්බන්ධවූ ඔප්පුද ගෙනෙන්ට ඕනෑය.

වර්‍ෂ 1931ක්වූ ජුලි මස 23වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ජී. ටී. ඩයිසන්,
උතුරු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පත්තිරිප්පුවේ ප්‍රසිද්ධ වැසිකිළියක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 6,726. ගම—පත්තිරිප්පුව.

| නො. | ඉඩමේ නම. | අඳුම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඊස්ටර්සිටන් .. | තල්වත්ත .. | සීමාසහිත ඊස්ටර්සිටන් පොල්වතු සමාගම .. | 0 0 20 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 2වෙනි දින පෙරවරු 11යේ කාලයට මඩකලපු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1931ක්වූ ජුලි මස 23වෙනි දින
මඩකලපු කච්චේරියේදීය.

සී. හැරිසන් ජෝන්ස්,
නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කැබිලිපාන ඇවිගය හරහා තිබෙන කඹි පාලමට යාමට පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ; ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 18. ගම—හකුමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 6A | මොරගහම්විට .. | ඔවිට .. | බී. ඇම්. ගුණසේකර සහ තවත් අය .. | 0 0 10·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 28වෙනි දින පෙරවරු 11.30යේ කාලයට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1931ක්වූ ජුලි මස 23වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

සී. එච්. කොලින්ස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

මෙහි පහත සඳහන්වෙන මධ්‍යම දිසාවේ තොටුපල් රේන්ද වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 16වෙනි දින පටන් දෙසැම්බර් මස 31වෙනි දින දක්වා මහනුවර නාගරික සභාවෙන් බදු ගැනීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මහනුවර නාගරික සභාවේ ප්‍රධාන තැනැත්තා විසින් භාරගනු ලැබේ. මතකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්වලොප් උඩ "Tender for Toll Rents" "තොටුපල් සඳහා ඉල්ලුම්පත්‍ර" යන වාක්‍යම ඇතුව වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 15වෙනි ශනි දින උදේ 8 වනතුරු මහනුවර නාගරික සභාවට භාරගනු ලැබේ. එවිට එහිදී ඒවායේ මුද්‍ර කඩාබලනවා ඇත. තවද ඉල්ලුම් පත්‍ර දී සිටින සැමදෙනාම ඉදිරිපිටට ඇවිත් තමන්ගේම අතින් ඒවා භාරදෙන්ට ඕනෑය.

2. නාගරික සභාවේ ප්‍රධාන තැනැත්තා විසින් නාගරික සභාව වෙත ඔප්පුකරසිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දෙකෙන් කොටසකට වැටහෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තිබන්ට ඕනෑවා පමණකුත්නොව එම ඉල්ලීම නාගරික සභාව විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනෙන් ඉතිරි පංගුවකට වටිනා ඇප තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

3. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රිජිස්තර්කිරීමටත් ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

4. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත් නැතිබවට ඉඩම් ලියා සටහන්කරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මෙම සහතිකපත්‍රය ඇපදෙන තැනැත්තාගේ වියදමෙන් ලබාගත යුතුයි.

5. රේන්දකාරයා විසින් ඔහුගේම වියදමෙන් සෑහෙන ගණනක් බරු සහ තොටියෝද සපයාදෙන්ට සහ ආරක්ෂාකර ගන්ටද බැඳෙන්ට යෙදේ. එම බරු ඒට ඔබිනවාද යනුවත සහ තොටියන් ගණනද නාගරික සභාවේ ප්‍රධාන තැනැත්තාගේ කැමැත්තට ඒත්තුවෙන අන්දමට වියයුතුයි. තොටුපල්වල පාවිච්චිය පිණිස නාගරික සභාව විසින් කොල්ලෑව සපයාදෙන්ට සහ ආරක්ෂාකරන්ටද යෙදේ.

6. විකිණීමේ කොන්දේසි ගැන වැඩිදුර කාරණා නාගරික සභාවේ සෙක්‍රටාරිස් උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැක.

නාගරික සභාවට අයිති තොටුපල් රේන්ද.

(1) හල්ලොලුව තොටුපල.

ආර්. එච්. විසිට්හෝන්,
මහනුවර නාගරික සභාවේ ප්‍රධානතැන.

වර්‍ෂ 1931ක්වූ ජුලි මස 24වෙනි දින
මහනුවර නාගරික සභාවේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්‍ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### කළුතර දිස්ත්‍රික්කේ අරක්කු රේන්ද, 1931–32.

වර්‍ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්‍ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මාස 12ක, මීට යාකර තිබෙන A අක්ෂරය දරණ හැඩුල් පත්‍රයෙහි සඳහන්වන තැබෑරුම්වල අරක්කු විකිණීමේ කාති බලය (නොහොත් රේන්දය) සම්බන්ධ ටැන්ඩර් වර්‍ෂ 1931ක්වූ මාර්තු මස 20වෙනි දින සහ නොම්බර 7,837 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ (වර්‍ෂ 1931ක්වූ ජූනි මස 5වෙනි දින සහ නො. 7,858 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරණලද ඇක්සයිස් නොතීසියකින් අලුත්කරණලැබූ) "අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවලට" සහ වර්‍ෂ 1931ක්වූ ජූලි මස

29වෙනි දින නො. 7,872 දරන ආණ්ඩුවේ අතිරේක ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ දැන්වීම සහ සියලුම ඇක්සයිස් ලයිසන්වලට වැටහෙන සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව භාර ගනු ලැබේ.

2. ආණ්ඩුවේ උප ඒජන්තතුමාට සුදුසුයයි වැටහෙන අන් දමට යම්කිසි වැන්ඩරයක් භාරගැනීමට හෝ නොගැනීමට ඔහුට බලය තිබේ. ඒ බලයට යටත්ව (තීරුව සහ අරක්කු වල වටිනාකම හැර) රේන්දය වශයෙන් ඉතා වැඩි ගණන වැන්ඩර්කරනු අයට විකිණීමේ බලය දෙනවා ඇත.

3. සෑම වැන්ඩරයම නියම ෆෝරමයකින් කළයුතුය. එය කළුතර කච්චේරියෙන් ලබාගත හැක. එබඳු වැන්ඩරයට අවලංගු නොකරනු (කැන්සල් නොකරනු) රුපියල් 10ක මුද්දරයක් ඇලවිය යුතුයි. වැන්ඩරය භාරගත්තා හෝ නොගත්තා හෝ එහි වටිනාකම ආපසු දෙනු නොලැබේ.

4. එක එක තැබෑරුමට වෙන වෙනම වැන්ඩර් ෆෝරම පාවිච්චිකරන්ට ඕනෑය. එක තැබෑරුමකට එක් අයෙකුගෙන් එක වැන්ඩරයකට වඩා භාරගනු නොලැබේ. සියලුම වැන්ඩර් තමා නමින්ම දමන්ට ඕනෑය. ඒජන්ත කෙනෙකුගේ නමින් දමනලද වැන්ඩර් භාරගනු නොලැබේ.

5. කච්චේරියක හෝ මුදල් භාණ්ඩාගාරයක රුපියල් 500ක් බැඳ එහි කුවිතාන්සිය සෑම වැන්ඩරය සමග එවන්ට ඕනෑය. කුවිතාන්සියේ නොම්මරයද දිනද වැන්ඩරයේ සඳහන්කරන්ට ඕනෑය.

6. රේන්දය ලැබූ අය නොහොත් සළුවූ වැන්ඩර් කාරයා රේන්දය ලැබූ වහාම, රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන්කොට ඇප බැඳීමක් වශයෙන් රේන්දයේ වටිනාකමෙන් සුමාන 6ක වටිනාකමට වැටහෙන මුදලක් කච්චේරියේ බඳින්ට ඕනෑය.

7. වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 1වෙනි සෙනසුරාදා පෙරවරු 11ට හෝ ඊට මත්තෙන් කළුතර කච්චේරියට ලැබෙන ප්‍රකාර වැන්ඩර් එවිය යුතුයි. වැන්ඩර්කාරයෝ එකී වේලාවට කච්චේරියේ සිටින්ට ඕනෑය.

8. වැඩිදුර කාරුණු කළුතර කච්චේරියෙන් ලබාගත හැකිවේ.

ඇල්. ඇල්. හන්ටර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1931ක්වූ ජූලි මස 30වෙනි දින
කළුතර කච්චේරියේදීය.

A. ෂැඩුල් පත්‍රය.

කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද කොට්ඨාසය.

| නො. | කොට්ඨාසය. | පළාත. |
| --- | --- | --- |
| 1 | කළුතර තොටමුණේ .. | කලමුල්ල |
| 2. | එම .. | දියලගොඩ |

තැබෑරුම් අරින වසන වේලාවල්: උදේ 8ට සහ සවස 6.30ට

---

කෑගල්ල දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද පාඩුවට විකිණීම.

වර්ෂ 1931ක්වූ ජූලි මස 17වෙනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1931ක්වූ ජූලි මස 18වෙනි දින "ඩේලි නිව්ස්" සහ "දිනමිණ" පත්‍රවලද පළවූ මගේ දැන්වීමේ ප්‍රකාර නො. 1කේ, බලගම අරක්කු තැබෑරුමේ රේන්දය විකිණීම මෙයින් අත්හිටවන්ට යෙදුනා ඇත.

ඒ. ඊ. ක්‍රිස්ටෝෆෙල්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1931ක්වූ ජූලි මස 23වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.